තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය - 13 ශ්‍රේණිය

නිපුණතාවය - 13.2 නියෝජිත තාක්ෂණයේ මූලධර්ම හා යෙදවුම් ගවේෂණය කරයි

දයාබර දුවේ / පුතේ ,

අප වර්තමානයේ ජීවත්වන්නේ ඩිජිටල් විප්ලවයෙන්(Digital Revolution) පණගැන්වූ තොරතුරු යුගයකය. මානව වර්ගයා තම අදහස් හුවමාරු කර ගැනීමට විවිධ වෑයම් දැරූ බව අපට ඉතිහාසයෙන් දැනගත හැකිය. තොරතුරු සන්නිවේදනය දියුණුවීමත් සමඟ මානවයා දැනුමෙන් ස්වයංපෝෂිතවීමට පටන්ගෙන ඇත. තාක්ෂණික විප්ලවයේදී මානවයාගේ දියුණුවට හේතුකාරක වූ දේවල් අතරින් දුරකථන,පරිගණක, අන්තර්ජාලය සහ කෘත්‍රිම බුද්ධිය යනාදී දේවල් ඉමහත් සේවයක් ඉටුකරයි.

ඔබගේ විෂය නිර්දේශයේ 13 වන නිපුණතාවයේදී තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයේ නව නැඹුරුතා සහ අනාගත දිශානති ගවේෂණය පිළිබඳව අධ්‍යයනය කිරීමට ඔබට සිදුවෙයි.එම නිපුණතාවයේ 13.2 නිපුණතා මට්ටමේ එන පහත දැක්වෙන කරුණු පිළිබඳවද ඔබගේ අවධානය යොමු කරන්න.

මෘදුකාංග කාරක (Software agents), බහු කාරක පද්ධති (Multi agent system), නියෝජිත පද්ධතිවල යෙදවුම් පිළිබඳව ඔබ අවබෝධයෙන් සිටින බව අපගේ විශ්වාසයයි.එබැවින් ඔබගේ විෂය නිර්දේශයේ එන 13.2 නිපුණතා මට්ටමට අදාළ සටහන් නැවත කියවා පහත ප්‍රශ්න සියල්ලටම පිළිතුරු ලිවීමට උත්සහ කරන්න.

1) මෘදුකාංග කාරක/නියෝජිත (Software agents) කෙටියෙන් පැහැදිලි කරන්න.
2) මෘදුකාංග නියෝජිතයන්ගේ ප්‍රධාන ලක්ෂණ ලැයිස්තුගත කරන්න.
3) බහු කාරක/නියෝජිත පද්ධතියක්(Multi agent system) යනු කුමක්දැයි දක්වන්න.ඒවායේ ගති ලක්ෂණ කෙටියෙන් හඳුන්වන්න.
4) නියෝජිත පද්ධතිවල යෙදවුම්(Applications of agent systems ) හඳුනාගන්න.